# පුරාණ ගැමි ණය, පොලී, බදු සහ දඩ ක්‍රම

**පුරාණ ගැමියා සමාජයේ කුමන තරාතිරමක ජීවත් වුව ද යම් යම් අවස්ථාවන්හි දී තමනට අවශ්‍ය ද්‍රව්‍ය හෝ මුදල් ණයට ගැනීමට මැලි නොවූහ.** ඔවුන්ගේ සරල අව්‍යාජ දිවි වෙතෙහි දී

> **ණය ගෙවීමට නොහැකි නම් ඔවුහු නියහලා කොළ කා මිය යති.**

ඇතිවන යම් යම් අඩුපාඩු තම අසල්වැසියා සමඟ කෙරෙන මෙම අතමාරුවෙන් පමණක් සපුරා ගැනීමට ඔවුහු සමත් වූහ. එදිනෙද වේලට මදි පාඩු වන පොල් අඩලය, ඉඟුරු කැල්ල, ඌණු බික හෝ මිරිස් කරල තම අසල්වැසියාගෙන් ලබන්නේ නැවත කෙටි කාලයකින් ආපසු දීමේ බලාපොරොත්තුවෙනි. මෙයට අමතරව තම දරුවාගේ මඟුලට තුලාවට නැතිනම් නගරයේ උසස් පාසැලකට යැවීමට, ලොකු මුදලක් අතමාරුවට ගන්නේ එක්කෝ තමන්ගේ වටිනා ඉඩම් කොටසක් හෝ තර ගවයෙකු උගසට තැබීමෙනි. පසුකලක දී ඒවා නිරවුල් කර ගැනීමට නොහැකි වූ විට, ගැමියා පවසන්නේ එය තමා පූරුවේ සිට ගෙවීමට තිබූ ණයක් බවත්, සූළු මුදලකට ඒවා සින්න වූ බවත් ය. ජාති ජාතින් ණය ගෙවීමට ගැමියෝ රුසියෝ ය. මේ ආත්මෙදි නොහැකි වුවහොත් ලබන ආත්මෙදි හෝ ණය ගෙවීමට තරම් ඔවුහු අව්‍යාජ වෙති. එමෙන්ම, **පුරාණ ගැමියා ගමට පමණක් නොව රටට ලෝකයාට ද ණය වෙති.** ණයට දීමෙන් මුදලුත් මිතුරාත් නැති වන බැව් අදහන ඔවුහු "**අද මුදලට හෙට ණයට**" යනුවෙන් ණය දීමේ දී මතකයට නහා ගනිති.

ණය ලබා ගැනීම සම්බන්ධ වූ ඓතිහාසික සාධක විමසා බැලීමේ දී පෙනී යන්නේ භාණ්ඩ, මුදල් පමණක් නොව, යම් යම් ද්‍රව්‍ය ද ණයට තුරහට දුන් බවයි. එමෙන්ම, ඒ හා සම්බන්ධ වූ විවිධ කොන්දේසි හා සම්මුති ද පැවති බැව් පෙනී යයි. වර්තමානයේ මෙන්ම ණය ආපසු ලබා ගැනීමේ දී විවිධ ගැටළු පැණ නැඟුණු අතර ඇතැම් අවස්ථාවන්හි දී ඒවා ජීවිත වලට හිංසා පීඩා පැමිණවීම සහ ඇතැම් විට මරණයකින් ද කෙලවර වන බැව් පෙනේ.

**රොබට් නොක්ස්** විසින් කරන යම් යම් ප්‍රකාශන වලින් ඒ බැව් මනාව පිළිබිඹු වේ. ඔහුට අනුව, ණය ගැතියාගේ නිවසට යන අදළ නිලධාරියා ණය ආපසු ලබා නුදුනහොත් **නියහලා කොළ (Gloriosa Superba)** කවන බවට තර්ජනය කරනු ලබයි. **ණය ගෙවීමට නොහැකි නම් ඔවුහු නියහලා කොළ කා මිය යති.** මෙසේ ස්වකැමැත්තෙන් මිය යන්නවුන් වෙනුවෙන් ණය හිමියා

> **ඇතැම් අවස්ථාවන්හි දී ණය ගෙවීමට අපොහොසත් වන්නා තම තරුණ දියණිවරුන් ඒ වෙනුවට ණය හිමියාට පාවා දෙනු ලබති.**

වන්දි ගෙවීමක් අවසානයේ දී කරනු ලබන බව ද සඳහන් වේ. ඒ අනුව, ණය හිමියාට තම ණය මුදලත්, අලුතින් වියදමකුත් දැරීමට සිදුවන බැව් පෙනේ.

**ඇතැම් අවස්ථාවන්හි දී ණය ගෙවීමට අපොහොසත් වන්නා තම තරුණ දියණිවරුන් ඒ වෙනුවට ණය හිමියාට පාවා දෙනු ලබති.** කුඩා දරුවන් සිටී නම් ණය හිමියා තම ණය වෙනුවට ඔවුන්ව මෙහෙකාර කමට ගෙන යනු ලබයි.

ණය ලබා ගැනීම මෙන්ම ණය සඳහා පොලී ලබා ගැනීම ද පැවති බැව් පුරාණ සෙල්ලිපිවල සඳහන් වේ. හතරවැනි සියවසට අයත් **කිත්සිරිමෙවන් රජ** සමයේ පිහිට වූ බැව් සඳහන් වන පර්වත ලිපියක් වන **තෝනිගල** ලිපියේ සඳහන් වන අන්දමට **කිත්සිරිමෙවන් රජු** ඇමතිවරයෙකු විසින් වෙළඳ ආයතනයක තැන්පත් කළ ධාන්‍ය වර්ග කිහිපයක් වෙනුවෙන් ලත් පොලිය **තෝනිගල** විහාරයේ (**යහිසපවත** ආරාමයේ) වසරක් පාසා වස්කාලය තුළ පවත්වන පින්කම් හි නිරතවන භික්ෂූන්ට දන් පිළියෙල කිරීමට යෙද වූ බැව් සඳහන් වේ. (පොලිය හැඟවීම පිණිස මෙම ශිලා ලිපිවල යොද ඇති වචනය "**වෙස්**" හෙවත් "**වෙඩ**" වේ.)

"**..........අමෙති පහෙජ සිවය හ ප්‍රත**
**දෙවයහ යහසපවය............**
**මෙදෙ හකඩ දස අමණක වී**
**පිටදඩ හසහි වෙඩ අකල**
**හසහි වෙස්ම දෙ හසහි වෙඩ.....**"

(ඇමති පහෙජ සිවගේ පුත්‍ර වූ

දේව විසින් යහිස පර්වතයෙහි මෙ දෙයාළ දස අමුණක වියෙහි පළමු කරලේ අස්වැන්නේ පොලිය ද දෙවැනි කරලේ අස්වැන්නේ පොලිය ද.......)

**කඩුව සහ කිරිච්චිය අතට ගෙන දඩ ගෙවිය යුතු පුද්ගලයාගේ හිස් වැස්ම හා ඇඟ වැස්ම ඉවත් කර ක්ෂණිකව දඩ ගෙවීමට නියම කරයි.**

මෙමම ලිපියේ සඳහන් විස්තර අනුව, එම ධාන්‍ය වර්ග සඳහා භාවිත කළ පොලී ප්‍රමාණ සහ මිණුම් ක්‍රම ද, වාර්ෂික පොලිය ලබා ගත්තා අයුරු ද සටහන් වී ඇත.

පස්වන ශත වර්ෂයට අයත් **ලබු ඇට බැදිගල** සෙල්ලිපියේ සඳහන් වන අන්දමට "**සිරිනාග**" නම් පුද්ගලයෙකු විසින් තැන්පත් කළ කහවනු 100 සඳහා ලත් පොලිය දේවගිරි විහාරයේ පින්කම් උදෙසා පරිත්‍යාග කර තිබේ.

" **මහතබක නියම - න (නහිදෙ) වගරිය මහ විහරහි අමෙති සගයහ පුත සිරිනකයි උවනිකෙව කොටු අරියවස වටටය එක සතක - කහවණ දිණි මෙ එක සතක කහවණෙහි වෙඩ ගෙණය.....**"

(මහතබක නම් වෙළඳ ගමෙහි සඩසා ඇමති ගේ පුත් සිරිනාග විසින් දේවගිරි විහාරයෙහි ආර්ය වංශ පින්කම් උදෙසා කහවනු සීයක් පොලී උපදවනු පිණිස තැන්පත් කරන ලදී. එම කහවනු සියයයේ පොලිය ගෙන ......)

එකල තිබූ මෙමම පොලී ක්‍රමය වත්මන් බැංකු ක්‍රමයට සමරූපී වූවා විය හැකිය. එමෙන්ම එකල ජනයාගේ ආර්ථික කටයුතු අතර බදු අය කිරීමේ ක්‍රමයක් ද පැවති බව ඓතිහාසික තොරතුරු වලින් හෙළි වේ. එම බදු අතර වර්තමානයේ දී ද කථාබහට ලක්ව ඇති ජල බද්ද විශේෂ වේ. ජල බද්දට අමතරව **මුතු බද්ද, මත්ස්‍ය බද්ද** ආදී වශයෙන් වූ බදු ද තිබූ බව සඳහන් වේ.

පස්වන ශත වර්ෂයේ දී මෙරටට පැමිණි චීන ජාතික **පාහියන්** නම් භික්ෂුව විසින් ශ්‍රී ලංකාව පිළිබඳ කර ඇති විවරණයේ දී, **මුතු බද්ද** ගැන සඳහන් වේ. ප්‍රධාන දිවයිනට යටත්ව දූපත් ඇති බවත්, ඉන් එක් දූපතක වටිනා මුතු උපදන බවත්, ඉන් ලැබෙන මුතු ඇට දහයකින් තුනක් බද්දක් වශයෙන් රජුට අයත් වූ බවත් සඳහන් වේ.

**ජල බද්ද**, ශිලා ලිපිවල සඳහන් වන්නේ "**දකපති**",

***දඩ නොගෙවන්නන් හට දුන් තවත් දඬුවමක් වන්නේ කටු සහිත වැලක් නිර්වස්ත්‍ර වූ දෙකලවා අතරින් ඇදීමය.***

"**දකපෙත**" ආදී නම් වලිනි. **වසභ රජ** සමයට අයත් **පෙරියම් කුලම් ගිරි** ලිපියෙන් **සුදර්ශන** නම් පියන්ගල්ල විහාරයෙහි භාවනා ශාලා බිමට අඳුන් දිවිසම් අතුරවීම සඳහා බතකගේ පුත්‍ර **නාග** විසින් කෙතවලක වැවේ **දිය බද්ද** යොදවා ඇත. එමෙන්ම, **1 වන ගජබාහු (ක්‍රි.ව. 173-195)** විසින් කරවන ලද ථූපාරාම සෙල් පුවරු ලිපියේ සඳහන් පරිදි, නගරයේ පිහිටි "**ගොණගිරි උතවියෙන්**" ලැබෙන **දිය බද්ද** සහ රජයට දෙනු ලබන බද්ද රතනාරාම විහාරයේ සංඝයා වහන්සේලාට දනය පිණිස ලබා දී තිබේ. නගරයේ ගණකාධිකාරී තැන විසින් නුවර වැවේ දිය බද්ද ද මේ සඳහා පවරා දී ඇති බැව් සඳහන් වේ.

මේ අනුව, එකල ජනයා විසින් තම ණය මුදල් වෙනුවෙන් අය කර ගත් පොලී මෙන්ම බදු මුදල් ද නීතිමය තත්ත්වයක් යටතේ ලබාගත් අතර ඒවා මෙලොව වැඩ සඳහා පමණක් නොව එලොව වැඩ සඳහා ද යොදවා ඇති බැව් යට සඳහන් කරුණු අනුව පෙනී යයි.

මීට අමතරව, දඩ ගැසීමේ ක්‍රමයක් ද එකල පැවතුණි. පොලී හා බදු අය කරගන්නා ආකාරය මෙන් නොව දඩ ගැනීම තරමක් හිංසාකාරී තත්ත්වයකින් පැවති බැව් පෙනී යන්නේ, **නොක්ස්** විසින් පවසන පහත සඳහන් කරුණු අනුවය. එනම්, රටේ පවතින යම් කිසි නීතියක් හෝ චාරිත්‍රයක් කඩ කරනු ලබන පුද්ගලයාට දෙන දඬුවමක් වූ මෙය, නීතිය අනුව අධිකරණ නිලධාරියා දඩ ගෙවිය යුතු පුද්ගලයා දුටු සැණින් ඔහු නවත්වා, **කඩුව සහ කිරිච්චිය අතට ගෙන දඩ ගෙවිය යුතු පුද්ගලයාගේ හිස් වැස්ම හා ඇඟ වැස්ම ඉවත් කර ක්ෂණිකව දඩ ගෙවීමට නියම කරයි.** එය කිරීමට අපොහොසත් වූවහොත් ඔහුගේ පිට කොන්ද මත ගලක්

***32 වෙනි පිටුවට..........***

**එම්.ඩී. සුසිලා ලූර්දු**

***පර්යේෂණ නිලධාරිණී***

**ප්‍රවෘත්ති හා ප්‍රකාශන ඒකකය**

හෙක්ටර් කොබ්බෑකඩුව

ගොවි කටයුතු පර්යේෂණ

හා පුහුණු කිරීමේ ආයතනය

34 වෙනි පිටුවෙන්..........(ඉතිරි)

# පුරාණ ගැමි ණය, පොලී, බදු සහ දඩ ක්‍රම

පටවනු ලබයි. දඩ මුදල ගෙවන තෙක් එම බර දැරිය යුතු අතර නඩුවේ පැමිණිලිකරු වැඩි හිරි - හැර නොකරන මෙන් ඉල්ලා සිටින තුරු මෙම දඬුවමට විත්තිකරු යටත් වේ. **දඩ නොගෙවන්නන් හට දුන් තවත් දඬුවමක් වන්නේ කටු සහිත වැලක් නිර්වස්ත්‍ර වූ දෙකලවා අතරින් ඇදීමය.** වැරදිකරු කලබල කළහොත් ඔහුගේ අත් පා බැඳ මෙම ක්‍රියාව කරනු ලබයි.

මෙම ණය, පොලී, බදු සහ දඩ අයකර ගැනීම හා පැන වීම එකිනෙකට වෙනස් නමුදු ඒවායේ යම්කිසි සමගාමී බවක් පැවති අතර මෙම තත්ත්වයන් විවිධ ආකාරයේ වෙනස්වීම් වලට බඳුන් වෙමින් අඩු වැඩි වෙමින් සමාජයේ අද දක්වාම විකාශනය වෙමින් පවතින බවත් එසේ වුවද වර්තමානයේ මෙම ණය, පොලී බදු සහ දඩ සම්බන්ධයෙන් කායික හිංසා යටපත් වී මානසික හිංසනයන්ට බරව ක්‍රියාත්මක වන බැව් ද පැහැදිලි වේ.

***(1994 ගොවි ජනතා සහරාවේ ලිපියක් ඇසුරින් සකස් කරන ලදී.)***